## <u>හත් වන ශ්‍රේණියේ සිට අපොස සා/පෙළ දක්වා නාට්‍ය හා රංග කලාව ප්‍රයෝගික ක්‍රියාකාරකම් පාඨමාලාව **(Drama Beyond the Classroom Programme)** මැයි 2025</u>

<u>**වැඩසටහන පිළිබඳ හැඳින්වීමක්:**</u>

නාට්‍ය හා රංග කලාව ඉගෙනීම ට සහභාගී වන දරුවන්ට එය ප්‍රීතිමත් අත්දැකීමක් බවට පත් කිරීම වැඩසටහනේ මූලික අරමුණයි. නාට්‍ය හා රංග කලාවේ මූලික අංග දරුවාට පහසුවෙන් තේරුම් ගත හැකි අයුරින් ඉදිරිපත් කර ඇති අතර එමඟින් තුලනාත්මක අවබෝධයක් හා ළමුන්ගේ ක්‍රීඩාශීලිත්වය, ප්‍රබෝධමත්භාවය සහ මූලික කලා ශිල්ප එනම්, සංගීතය, නැටුම්, රංගනය යනාදිය පිළිබඳව ළමුන්ගේ රසඥතාවය වර්ධන කිරීමය.

මෙම වැඩසටහන සමස්තයක් ලෙස කලින් සැලසුම්කරණ ලද ක්‍රියාකාරකම් මත පදනම් වන අතර එමගින් ඔවුන් අන්යෝන්‍ය දයාව, ලෝකාවබෝධය, මානව සබඳතා පිළිබඳ අත්දැකීම්, සමාජ-සංස්කෘතික වටිනාකම් සහ මූලික කලා ශිල්ප පිළිබඳ අවබෝධය සහ ආත්මවිශ්වාසය සහ ගෞරවය වැනි නාට්‍ය හා රංග කලාවේ වැදගත්ම ඉගෙනුම් ප්‍රතිඵල අත්විඳීමට දරුවාට අවස්ථාව ලබා දෙයි.

<u>කාට ද:</u>

මෙම වැඩසටහන මූලික වශයෙන් නිර්මාණය කර ඇත්තේ පාසලේදී නාට්‍ය සහ රංග කලාව විෂයයක් ලෙස හදාරන හත් වන ශ්‍රේණියේ සිට අපොස සා/පෙළ දක්වා ළමුන් සඳහා ය. කෙසේ වෙතත්, වැඩසටහන ක්‍රියාකාරකම් මත පදනම් වූවක් බැවින් නිර්මාණශීලී සහ කුතුහලයෙන් යුතු ඕනෑම සිසුවෙකුට වැඩසටහනට සම්බන්ධ විය හැකිය. එවැනි සිසුන් සඳහා මෙම වැඩසටහනේ ක්‍රියාකාරකම් දරුවා පාසලේදී ලබා ගන්නා විධිමත් අධ්‍යාපනයට අතිරේකයක් ලෙස ද සැලකිය හැකිය.

<u>**ඉගෙනීමේ ප්‍රතිපල:**</u>

මෙම වැඩසටහන සහභාගිවන ළමුන්ට පහතින් දී ඇති මූලික කරුණු ඉගෙන ගැනීමට සහ අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දේ

- නාට්‍ය හා රංගනයේ ආරම්භය, ස්වභාවය සහ විවිධ ශෛලීන්
- නාට්‍ය රංගනයේ විවිධ ක්‍රම
- විකල්ප ප්‍රකාශන මාධ්‍යයක් ලෙස නිදහස් හා ව්‍යුහගත චලනයන්
- සංගීත ය ඇගයීම සහ ගායනය
- චිත්‍ර, අත්වැඩ සහ රූකඩ
- භාෂා ප්‍රවීණතාවය.

වැඩසටහන මෙහෙයවන්නේ මහාචාර්ය චන්දන අලුත්ගේ සහ නිලංක දහනායක විසිනි. මීට අමතරව, ළමුන් සමඟ වැඩ කිරීම සඳහා විශේෂ පුහුණුවක් ලබා ඇති කලාකරුවන්/නාට්‍ය ගුරුවරුන් ද වැඩසටහන මෙහෙයවීමට සහාය වේ.

<u>**කාලය:**</u>

වැඩසටහනට වසරකට වාර තුනක් ඇත. එක් වාරයක කාලය සති දොළහකි. සෑම වසරකම පළමු වාරය ජනවාරි සිට මාර්තු දක්වා ද, දෙවන වාරය මැයි සිට ජූලි දක්වා ද තුන්වන වාරය සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා වේ. 2025 දෙවනු වාරය මැයි 3 වන දින ආරම්භ වේ. වැඩසටහන සති 12 ක කාලයක් මැයි 3 වනදා සිට ජූලි 19 දක්වා සෙනසුරාදා දිනවල දී පෙරවරු 11.15 සිට පස්වරු 02.15 දක්වා පවත්වනු ලබයි.

සහභාගි වන දරුවන්ට තම ආහාර පාන රැගෙන එන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. නාට්‍ය සැසිවාරයට සහභාගි වීමට දරුවන්ට සුදුසු ඇඳුම් (වඩාත් ලිහිල් ඇඳුම්) සැපයිය යුතුය.

<u>**අයකිරීම:**</u>

වැඩසටහන සඳහා ගාස්තුව එක් වාරයකට ළමයෙකුට රු. 6000/= ක් සහ ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 500/= කි. ලියාපදිංචියේදී සම්පූර්ණ ගාස්තුව (රු. 6500/=) එක් වාරිකයකින් ගෙවන ලෙස දෙමාපියන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

<u>**ස්ථානය:**</u>

**බත්තරමුල්ල ජයන්තිපුර ප්‍රධාන මාර්ගයෙහි පිහිටි බත්තරමුල්ල සිංහ සමාජ ශාලාවේදී වැඩසටහන පවත්වනු ලබයි.**